# දැන්වීමයි

## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. කළමනාකරු (කර්මාන්තශාලා) - කළමනාකාර සේවා ගණය (MM 1-1) - තනතුරු 01

MM 1-1 - රුපියල්. 53,175- 10 X 1,375 -15 X1,910 -95,575/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහාද හිමිකම් ලබනු ඇත.

(2024.01.01) දිනට හිමි ආරම්භක වැටුප - රුපියල්.53, 175 /-

**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 01 හෝ 02)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා / ඉංජිනේරු විද්‍යාවේදී / නිෂ්පාදන කළමනාකරණය / විදුලි ඉංජිනේරු විද්‍යාව විෂයයන්ගෙන් උපාධියක් ලබාගෙන තිබීම.

   සහ

   උපාධිය ලැබීමෙන් පසුව රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිලිගත් පෞද්ගලික නිෂ්පාදනාගාරයක මාණ්ඩලික මට්ටමේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක යටත් පිරිසෙයින් වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

2. තෘතීය / වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   මෙම සුදුසුකම් ලැබීමෙන් පසුව රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිලිගත් පෞද්ගලික ආයතනයක ඖෂධ නිෂ්පාදනාගාරයක මාණ්ඩලික මට්ටමේ තනතුරක වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 01 හෝ 02)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කනිෂ්ඨ කළමනාකාර"JM 1 - 1 සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම් කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 02. පරිගණක හා දත්ත නිලධාරී -කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණය(JM 1-1) - තනතුරු 01

JM 1-1 - රුපියල්.42,600 -10 ×755 - 18 × 1,135 - 70,580/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහාද හිමිකම් ලබනු ඇත.

(2024.01.01) දිනට හිමි ආරම්භක වැටුප - රුපියල්.42, 600 /-

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 01 හෝ 02 හෝ 03)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් පරිගණක විද්‍යා උපාධියක් ලබා තිබීම.

    සහ

    සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිලිගත් පෞද්ගලික ආයතනයක පරිගණක පද්ධතීන්වලට අදාළ ක්ෂේත්‍රයක වසර දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

02. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි NVQ හයවැනි (06) හෝ NVQ හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

    සහ

    සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිලිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි NVQ පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

    සහ

    සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිලිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 01 හෝ 02)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1 - 1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ පරිගණක ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 03. කෘෂිකර්ම නිලධාරී -කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණය(JM 1-1) - තනතුරු 01

JM 1-1 - රුපියල්. 42,600 -10 ×755 - 18 × 1,135 - 70,580/- රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහාද හිමිකම් ලබනු ඇත.

(2024.01.01) දිනට හිමි ආරම්භක වැටුප - රුපියල්.42, 600 /-

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් කෘෂිකර්ම උපාධියක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක , මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිලිගත් පෞද්ගලික ආයතනයක වගා කටයුතු සම්බන්ධයෙන් වසර දෙකක (02) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 01 හෝ 02)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1 - 1 ) සේවා ගණයෙහි II ශ්‍රේණියේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත්**

සෑම අයදුම්කරුවෙකුම ,

a. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
b. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
c. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය**

පත්වීම් බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවා ගනු ලැබේ.සේවක අර්ථ සාධක අරමුදලට පත්වීම් ලාභීන්ගෙන් 8% ක් ද, සේවා යෝජකයාගෙන් 12% ක් වශයෙන් දායක මුදල් ගෙවිය යුතුය. ඊට අමතරව සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට පත්වීම්ලාභියාගේ වැටුපෙන් 3% ට සමාන මුදලක් ගෙවනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ජීවදත්ත සහ අදාළ සහතිකවල, සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය. සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තමා විසින් පිලියෙල කරගත් අයදුම්පතක් **සභාපති, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, නො:94, පරණ කොට්ටාව පාර, නාවින්න මහරගම** යන ලිපිනයට 2024.12.06 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඔබගේ දුරකථන අංකය සහ ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ ලිපිනයන් සහ දුරකථන අංකයන් අයදුම්පතෙහි සඳහන් කර තිබිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

ඉහත තනතුරු කිහිපයකට අයදුම්කරන්නේ නම් වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුයි.

තැපැලෙන් අස්ථානගතවන හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් පිළිබඳ අප සංස්ථාව වගකියනු නොලැබේ.

**සභාපති**
**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**